**ශීර්ෂය 429 - ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුලි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2187/27 දරන 2020 අගෝස්තු 09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවන ලද බැවින් ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයක් නොවිය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

-----------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගත් රු.1,022,573 ක් වූ ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ, යන්ත්‍ර සූත්‍ර උපකරණ පිලිබඳ විස්තර මූල්‍ය නොවන වත්කම් පිලිබඳ ප්‍රකාශයට ඇතුලත් කර නොතිබුණි. | ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් 2020 වර්ෂයේදී CIGAS වැඩසටහන යටතේ ප්‍රාග්ධන වත්කම් සංචිත ගිණුමක් (Capital Asset Reserved) සක්‍රිය කර නොගැනීම හේතු කොට ගෙන 2020 භාණ්ඩාගාර මුද්‍රිත සටහන් වල එම ගිණුමේ ශේෂයක් පෙන්නුම් නොකරයි. එසේවීම හේතුකොට ගෙන 2020 මූල්‍ය ප්‍රකාශන වල 2020 වර්ෂය වෙනුවෙන් අත්පත් කරගත් ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ, යන්ත්‍ර සූත්‍ර උපකරණ වල වටිනාකම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් නොකරන ලදී. 2021 පෙබරවාරි මස ප්‍රාග්ධන වත්කම් සංචිත ගිණුම ක්‍රියාත්මක කර අදාල වත්කම් CIGAS වැඩසටහන යටතේ ගිණුම් ගතකර ඇති බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පරික්ෂාකර නිවැරදි තොරතුරු ඇතුලත් වන බවට තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට අනුව වෙනත් ලැබීම් රු.191,184 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.429,333 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.238,149 ක් වැඩියෙන් දක්වා තිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් වර්ගීකරණය අනුව වෙනත් ලැබීම් ලෙස ආදායම් ශීර්ෂ යටතේ ලැබීම්වල එකතුව සටහන් කර ඇත. (රු.191,184) වැය ශීර්ෂ වලට සිදු කරන ලද අධිභාර වට්නාකම් වල ශුද්ධ බලපෑම සමඟ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වැය වියදම් සඳහන් කර ඇති හෙයින් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි ආදායම් නොවන ලැබීම් වලින් අධිභාර ලැබීම් ඉවත් කර සටහන් තබා ඇති බව දන්වමි. නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කිරීමේදී අමාත්‍යාංශයේ ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ ශේෂ පදනම් කර ගෙන ගණනය කිරීම් සිදු කර ඇති හෙයින් ආදායම් නොවන ලැබීම් ලෙස සියළුම බැර කිරීම් වල එකතුව ඇතුළත් කර ඇත. | පොදු සම්මත ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මුදල් ප්‍රවාහා ප්‍රකාශය සකස්කල යුතු වීම. |

### 1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) ස්ථාවර වත්කම් ලේඛනය** | | |
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශයේ ආයතනික හා මූල්‍ය කටයුතු කාර්ය මණ්ඩල හිඟතාවය හේතුකොට ගෙන 2020 වර්ෂය තුල විධිමත් පරිදි ස්ථාපිත නොවීම හේතුවෙන් ඇතැම් ලේඛණ හා පොත් පත් නඩත්තු කර නොමැති බව කාරුණිකව දන්වමි. නමුත් 2021 සිට ලේඛණ නඩත්තු කරනු ලබයි. | ස්ථාවර වත්කම් ලේඛනය චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව පවත්වා ගත යුතු වේ. |

(ආ) **බඩු ලේඛන පොත**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 454(1) ප්‍රකාරව බඩු ලේඛන පොතක් පවත්වා නොතිබුණි. (Inventory Book) | -එම- | මුදල් රෙගුලාසි 454(1) හි විධිවිධාන ප්‍රකාරව 44 වැනි පොදු ආකෘතිය පරිදි බඩු ලේඛන පොතක් යාවත්කාලීන කර පවත්වා ගත යුතු වේ. |

(ඇ) **ඇප ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වේ. |

(ඇ) **බැරකම් පිළිබඳ ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරික්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරික්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉටුකිරීමට සැලැසුම් කරන ලද කාර්.යයන් සඳහා රු.27,605,000 ක අග්‍රිම මුදලක් ඉල්ලුම් කර තිබුණ ද මහා භාණ්ඩාගාරය රු.10,400,000 ක් නිදහස් කර තිබුණි. ඒ අනුව ඉල්ලුම් කරන ලද අග්‍රිමයෙන් සියයට 62 ක් ලැබී නොතිබුණි. | 2020 අගෝස්තු මස 09 වන දින ප්‍රකාශිත අංක 2187/27 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත වීමෙන් අනතුරුව අනුමතවූ වාර්ෂික ඇස්තමේන්තුව පදනම් කරගෙන අග්‍රිම සැලසුම් කරන ලදී. නව අමාත්‍යාංශයේ කටයුතු ස්ථාපිත කිරීමේදී පැවතුනු භෞතික සම්පත්වල හිඟතාවය හා කාර්ය මණ්ඩල ඌනතා හේතුවෙන් | අයවැය ලෙබන පාලනය විචලතා අඩුවන පරිදි පුරෝකතනය සිදුකල යුතු වේ. |

| | | |
|---|---|---|
| | අපේක්ෂිත පරිදි වියදම් සිදු නොවීම හේතු කොට ගෙන මාසික අක් මුදල් අයදුම්පත් මඟින් භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ලබා ගත් මුදල රු. 10,400,000 ක් වන බව පිළිගනිමි. | |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වියදම් ශීර්ෂ 05 ක් සඳහා සලසන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.3,675,000 ක් උපයෝජනය නොකර සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණි. | අනුමත කාර්ය මණ්ඩලයේ පවතින ඌනතා හේතුවෙන් අමාත්‍යාංශයේ ආයතනික කටයුතු අංශ වශයෙන් ගොඩ නැගීමට 2020 දෙසැම්බර් මාසය දක්වා ද නිසි පරිදි සිදු කර ගැනීමට අපහසු වූ හෙයින් අත්‍යවශ්‍යම ගෙවීම් වාරිමාර්ග අමාත්‍යාංශය හරහා සිදු කරන ලදී. 2020 දෙසැම්බර් මාසයේ සිට ගණකාධිකාරීවරයෙක් පත් කරන ලදි. සීමිත නිලධාරීන් පිරිසක් සමග ගිණුම් අංශය ස්ථාපිත කරන ලදී. ආයතන කටයුතු ද විධිමත් පරිදි ගොඩනැගුණේ 2021 ජනවාරි මාසයේ ස්ථීර වශයෙන්ම අතිරේක ලේකම්වරියගේ පැමිණීමෙන් අනතුරුවය. මෙවැනි තත්වයක් තුළ 2020 අයවැය සැලසුම් සහගතව උපයෝජනය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට අපොහොසත් වීම නිසා ඇතැම් වැය ශීර්ෂ වල ප්‍රතිපාදන උපයෝජනය සම්පූර්ණයෙන් ඉතිරි වුනු අතර ඇතැම් වැය ශීර්ෂ වල ප්‍රතිපාදන ඉතිරිය 20 – 97 ක පරාසයක් ගත් බව පිළිගනිමි. තවද නිලධාරීන්ගේ හිඟය හා 2020 වර්ෂය තුළ සංවර්ධන ව්‍යාපෘතියක් සක්‍රියව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ක්ෂේත්‍ර රාජකාරි සීමාවීම හේතු කොට ගෙන ගමන් වියදම් සඳහා ද අපේක්ෂිත පරිදි වියදම් සිදු නොවිණි. | අයවැය සකස් කිරීමේදී හැකිතාක් දුරට විචලතා අවම වන පරිදි සිදුකල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඇස්තමේන්තු සකස්කිරීමේ දී අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව වෙන්කිරීම් සිදු කිරීම සහ සැලැසුම් කරන ලද පරිදි වැඩ කටයුතු සිදු නොකිරීම යන හේතු නිසා වැය විෂයයන් 11 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.109,900,000 ක් වූ ශුද්ධ වෙන්කිරීම් වලින් එකතුව රු. 36,728,183 ක් හෙවත් සියයට 33 ක් ඉතිරි වී තිබුණි. එක් එක් වැය විෂය යටතේ වූ ඉතිරිය සියයට 20 ත් සියයට 97 ත් අතර පරාසයක් ගෙන තිබුණි. | 2020 අගෝස්තු 09 වන දින ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත විය. අනුමත කාර්ය මණ්ඩලයේ පවතින ඌනතා හේතුවෙන් අමාත්‍යාංශයේ ආයතනික කටයුතු අංශ වශයෙන් ගොඩ නැගීමට නොහැකි වුණි. එම නිසා වැය ශීර්ෂවලට වෙන් කරන ලස මුදල් ඉතිරිවීම් සිදුවිය. තවද නිලධාරීන්ගේ හිඟය හා 2020 වර්ෂය තුළ සංවර්ධන ව්‍යාපෘතියක් සක්‍රියව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ක්ෂේත්‍ර රාජකාරි සීමාවීම හේතු කොට ගෙන ගමන් වියදම් සඳහා ද අපේක්ෂිත පරිදි වියදම් සිදු නොවිණි. | අයවැය සකස් කිරීමේදි හැකිතාක් දුරට විචලතා අවම වන පරිදි සිදුකල යුතු වේ. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

--------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ------------------------------------ | ------------ |
| මූල්‍ය ප්‍රකාශන සමඟ වූ බැදිම් හා බැරකම් පිලිබඳ ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂය සඳහා වූ බැරකම් රු.4,832,702 ක ලෙස දක්වා තිබුණි. 2021 ජනවාරි සිට මාර්තු 31 දක්වා වූ කාල සීමාව තුළ 2020 වර්ෂයට අදාල රු.5,136,845 ක් වූ බැරකම් පියවා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශනයන්හි බැරකම් රු.304,143 කින් අඩුවෙන් දක්වා තිබුණි. | 2020 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන දින වන 2021/02/28 දිනට හඳුනාගත් සියළුම බැරකම් හා බැදීම් මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති අතර එහි වටිනාකම රු.4,832,702 ක් වේ. ඉන් පසු අනාවරණය වූ අත්‍යවශයෙන්ම ගෙවියයුතු අමාත්‍ය කාර්යමණ්ඩලයේ අතිකාල හා ගමන් වියදම් ගෙවීම් හා දුරකථන බිල්පත් ගෙවීම් කිහිපයක් ද 2021 ජනවාරි - මාර්තු 31 දක්වා නිරවුල් කිරීමට සිදුවුණි. අමාත්‍යාංශයේ ආයතන කටයුතු හා මූල්‍ය කටයුතු විධිමත්ව 2020 වර්ෂය තුළ සංවිධානය නොවීම නිසා ගරු අමාත්‍යතුමාගේ කාර්යමණ්ඩලය හා අමාත්‍යාංශ කාර්ය මණ්ඩල වල ගිණුම් පියවීමේදී සියළුම වවුචර් ඉදිරිපත් කර නොතිබීමෙන් මෙවැනි වාර්තා කිරීමේ දෝෂ පැන නැගුණු බව වැඩි දුරටත් දන්වමි. ඉදිරියේ දී මෙවැනි දෝෂ මගහරවා ගැනීමට සටහන් කර ගතිමි. | සියළුම බැරකම් හා බැදීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-----------------------------------------------------**

නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නිරීක්ෂණය** | | **ගණකාධිකාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (අ) මුදල් රෙගුලාසි 756 | භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | වාරිමාර්ග අමාත්‍යාංශය හා ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව් ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ජාවත්ත පරිශ්‍රය තුල එකම ස්ථානයක ස්ථාපිත වී පැවතීම හේතුකොටගෙන රාජ්‍ය අමාත්‍යාංශයේ නව අංශය ස්ථාපිත කිරීමේදී වාරිමාර්ග අමාත්‍යාංශයේ ඉන්වෙන්ට්‍රිවලට අයත් භාණ්ඩ හුවමාරු කරගන්නා ලදී. එහෙයින් 2020 වර්ෂය තුල රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් වෙනවෙනම භාණ්ඩ සමීක්ෂණය සිදුකිරීමට නොහැකිවූ අතර ජාවත්ත පරිශ්‍රය තුල පවතින සියලුම භාණ්ඩ වෙනුවෙන් වාරිමාර්ග අමාත්‍යාංශ යටතේ භාණ්ඩ සම්බන්ධයෙන් පවත්නා වාර්තා ඉදිරිපත් කර ඇත. 2021 වර්ෂයේදී අමාත්‍යාංශයේ පොත්වල ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | මු.රේ 756 ප්‍රකාර භාණ්ඩ සමීක්ෂණ වාර්ත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු වේ. |
| (ආ) මුදල් රෙගුලාසි 103(1)(අ) | හදිසි අනතුර සිදු වූ අවස්ථාවේ බලධාරීන් වෙත වාර්තා කල යුතු වුව ද අනතුරට ලක්වී තිබුණ වාහනයක් සම්බන්ධයෙන් එසේ වාර්තා කර නොතිබුණි. | රාජ්‍ය අමාත්‍යතුමා වෙත ලබාදී ඇති වාහනයක් වූ අතර රාජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්තව කටයුතු කරනු ලබන රියදුරෙකු විසින් මෙම රථය අනතුරට භාජනය වන අවස්ථාවේදී | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

ධාවනය කර ඇත. රජයේ දේපළ පරිහරණය පිළිබඳව අනවබෝධය හේතුකොටගෙන මුදල් රෙගුලාසි 103 ප්‍රකාරව කටයුතු කර නොමැති අතර ඉදිරියේ දී මෙවැනි අවස්ථාවක ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව සියලුම රියදුරන් දැනුවත් කර ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමණාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය 2020 වර්ෂය තුළ කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. වැය විෂය අංක 2509 යටතේ සිරිසර පිවිසුම් ව්‍යාපෘතිය සඳහා රු.මි.79.65 ක් වෙන් කර තිබුණි. ජනාධිපති ලේකම් කාර්යාලය වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක කර තිබූ උක්ත ව්‍යාපෘතියේ 2019 වර්ෂයේ බැරකම් වෙනුවෙන් රු.60,809,765 ක ප්‍රතිපාදන ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් වෙත නිදහස් කර තිබුණද ඒ පිළිබඳව විස්තර ලබාගෙන නොතිබුණි. ඒ යටතේ වර්ෂය තුළ රු.59,933,248 ක වියදම් දරා තිබුණි. මුදල් රෙගුලාසි 146 ට අනුකූල එම වියදම කුමන කාර්යයන් සඳහා දරන ලද්දේද යන්න, එකි එක් එක් කාර්යයේ ප්‍රගතිය, නිම නොවී පවතින වැඩ කොටසක් හා ඒ සඳහා තවදුරටත් ගෙවිය යුතු වියදම පිළිබඳ විමසිලිමත් වී නොතිබුණි. | 2020 වාර්ෂික ඇස්තමේන්තු වල සිරිසර පිවිසුම ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ 2019 වර්ෂයේ බැරකම් පියවීම සඳහා වැය විෂය අංක 2509 යටතේ මිලියන 79.65 ක් වෙන් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ ඒ වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් කර ගෙවීම් පියවීම පමණක් පැවති හෙයින් අතැති බිල් කඩිනමින් නිරවුල් කර 2020 වැය ශීර්ෂ කිහිපයකින් සිදු කරන ලද වියදම් නිවැරදිව 2020 ගිණුම් පියවීමට පෙර සිදු කළ යුතු බව ජනාධිපති ලේකම් කාර්යාලයෙන් හා අය වැය දෙපාර්තමේන්තුව මඟින් උපදෙස් ලැබුණි. එහෙයින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම්ගේ සහ ජනාධිපති කාර්යාලයේ ප්‍රධාන මූල්‍ය නිලධාරීගේ ඉල්ලීම පරිදි ප්‍රතිපාදන කඩිනමින් නිදහස් කිරීමට සිදුවුණි. තවද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේය. ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ලබා ගත් බැරකම් පිළිබඳ විස්තර ඉදිරිපත් කරමි. | ගණන්දීමේ නිලධාරීන් අතර කෙරෙන ගනුදෙනු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි මඟින් නියම කර ඇති විධිවිධාන අනුගමනය වන බවට සහතික වීම පිණිස ඊට අදාල අභ්‍යන්තර පාලන පද්ධතිය නැවත සමාලෝචනයට ලක්කර අවශ්‍ය පාලනයන් හඳුනවාදිය යුතු වේ. |

## 3.2 බාහිර පාර්ශවයන්ට අයත් වත්කම් පරිහරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රාජ්‍ය අමාත්‍යාංශය විසින් බාහිර පාර්ශවයන්ට අයිති පිරිවැය රු.137,900,000 ක මෝටර් වාහන 13 ක් භාවිතා කරමින් පැවති අතර ඒවා පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශයට අයිතිය පවරා ගැනීමට කටයුතු කරමින් පවතින අතර 2021 වර්ෂය තුල ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | බාහිර පාර්ශවයට අයත් වත්කම් පවරා ගැණීමට කටයුතු කල යුතු වේ. |

## 3. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ අනුමත කාර්යය මණ්ඩලය 70 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 31 ක් විය. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 39 ක් විය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින්, මෙම අමාත්‍යාංශය සඳහා නිලධාරීන් 70 කින් සමන්විත කාර්යය මණ්ඩලයක් සඳහා අනුමැතිය හිමිවිය. අනුමත කාර්යය මණ්ඩලය සම්බන්ධයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාශය වෙතින් ඉල්ලීම් සිදු කළද, වර්ෂය අවසානය වන තෙක්ම නිලධාරීන් අනුයුක්ත නොකරන ලදී. වාරිමාර්ග අමාත්‍යාංශයේ වැඩබැලීමේ පදනම මත නිලධාරීන් පත්කරගෙන ඇත. පවතින පුරප්පාඩු පුරවාදෙන ලෙස රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් කිහිප විටකම ඉල්ලීම් සිදු කර ඇත. සේවයේ නියුතු මුළු නිලධාරීන් සංඛ්‍යාව 31 වූ අතර, පුරප්පාඩු 39ක් පැවතුණි. | තනතුරු අවශ්‍යතා සමාලෝචනයට ලක්කර අවශ්‍ය කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 13 ක, තෘතියික මට්ටමේ තනතුරු 02 ක, ද්වීතියික මට්ටමේ තනතුරු 14 ක සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 09 ක පුරප්පාඩු පැවතියද එම තනතුරු වලට බඳවා ගැනිමට කටයුතු කර නොතිබුණි. | තනතුරු පුරප්පාඩුව පිළිබඳ රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, බහු කාර්යය සංවර්ධන කාර්යය සාධක බලකා දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ආදිය දැනුවත් කිරීමට කටයුතු කරන ලදී. | -එම- |